මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ **40** **2023.02.24**

2023 මාර්තු 09 දින පැවැත්වීමට නියමිතව ඇති ඡන්ද විමසීම සම්බන්ධව හා එහි නීත්‍යානුකූලතාව පිළිබඳව සාවද්‍ය අදහස් හා තොරතුරු ප්‍රකාශ වන බව නිරීක්ෂණය වන බැවින් ඒ පිළිබඳව මහජනතාව වෙත පැහැදිලි කිරීමක් කළ යුතුව පවතින බව මැතිවරණ කොමිෂන් සභාවේ අදහස වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම, පළාත් සභා මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම, පළාත් පාලන ආයතනවල සභිකයන් තෝරා පත්කර ගැනීම සහ ජනමත විචාරණයක් පැවැත්වීම සම්බන්ධයෙන් "**තත් කාලයේ බල පවත්නා නීතියක් මඟින්** මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ සියලු බලතල කාර්යය සහ කර්තව්‍යය මැතිවරණ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ද, ඉටු කරනු ලැබිය යුත්තේ ද සිදු කරනු ලැබිය යුත්තේ ද වන්නේ ය..." ලෙස ඡන්ද විමසීම් පැවැත්වීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව වෙත බලය ලබා දී ඇත.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව බල පවත්වනු ලබන නීතිය වන්නේ 2017 අංක 16 දරන පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 අධිකාරය) වේ. එම ආඥා පනතේ 24 වගන්තියේ දැක්වෙන්නේ පළාත් පාලන ආයතන සභිකයන් තෝරා පත් කර ගනු ලබන සෑම ඡන්ද විමසීමක් ම **මෙම ආඥා පනතින් මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන්** පවත්වනු ලැබිය යුතු බව ය. පළාත් පාලන ආයතනයක සභික ධූර කාලය, මහ නගර සභා ආඥා පනත (10 වගන්තිය), නගර සභා ආඥා පනත (10 වගන්තිය), ප්‍රාදේශීය සභා පනත (5 වගන්තිය) විධිවිධාන අනුව මාස 48ක කාලයකට සීමා වේ. එම පනත්වල එකී වගන්ති තුළ ම එම ධූර කාලය කෙටි කිරීමට හෝ දීර්ඝ කිරීමට විෂය භාර අමාත්‍යවරයාට බලය පවරා දී ඇති අතර, එම දීර්ඝ කිරීම හෝ කෙටි කිරීමේ උපරිම කාලය මාස 12ක් වේ.

පළාත් පාලන ආයතන 340ක් සඳහා සභිකයන් තෝරා පත් කර ගැනීමට 2018.02.10 දින පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අනුව අදාළ සභා පිහිටවනු ලැබුවේ 2018.03.20 දින වන බැවින් එම ආයතනවල සභික ධූර කාලය 2022.03.19 දින වන විට අවසන් වීමට නියමිත වූව ද විෂය භාර අමාත්‍යතුමා විසින් ඉහත වගන්තිවල සඳහන් බලතල ප්‍රකාරව මාස 12කින් එම සභාවල කාලය දීර්ඝ කිරීම හේතු කොට ගෙන 2023.03.19 දින වන විට සභික ධූර කාලය අවසන් වීමට නියමිතව තිබේ.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත 25 වගන්තිය ප්‍රකාරව "සභිකයන්ගේ ධූර කාලය ආරම්භ වීමට නියමිත දිනයට ඉහතින් ම වූ මාස හයක කාලසීමාවක් ඇතුළත ඡන්ද විමසීම **පවත්වනු ලැබිය යුතු ය**" යනුවෙන් සඳහන්ව ඇත. මාස 06ක කාලය ඇතුළත යනුවෙන් සඳහන් වූව ද සභා පිහිටුවීම සඳහා මෙයට පූර්වයෙන් විශාල කාල පරාසයක් තබා පළාත් පාලන ඡන්ද විමසීමක් පවත්වා නොමැති අතර, එසේ සිදු නොකරනු ලබනුයේ සභා පරිපාලනය සම්බන්ධව ගැටලු රාශියක් මතු වීමට පවතින ඉඩකඩ හේතුවෙනි. එසේ ම 2022 ඡන්ද හිමි නාමලේඛනය සහතික කරන ලද්දේ 2022.10.31 වන අතර, 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධිත) පනත අනුව අටලොස්විය සම්පූර්ණ වන තැනැත්තන් සඳහා පරිපූරක (අතිරේක නාමලේඛන) දෙකක් 2022 පෙබරවාරි 01 දින සිට මැයි 31 දක්වා හා 2022 ජූනි මස 01 දින සිට සැප්තැම්බර් 30 දක්වා කාල වකවානු සඳහා සකස් කළ යුතු වීමත්, එම පරිපූරක නාමලේඛනය සහතික කරන ලද්දේ නොවැම්බර් මස අග දී වන නිසාත්, එතෙක් ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කිරීම සිදු නොකරන ලදී. මෙම නාමලේඛන සහතික කිරීමට පෙර පළාත් පාලන ආයතන ඡන්දය ප්‍රකාශ කරන ලද්දේ නම්, තරුණ ඡන්ද ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයකට ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම අහිමි වේ. තරුණයන්ට එම ඡන්ද අයිතිය අහිමි වන පරිදි පියවර නොගැනීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී.

එසේම ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් සකස් කර තිබූ ඡන්ද හිමි නාමලේඛන පළාත් පාලන ආයතන ඡන්ද කොට්ඨාස මට්ටමින් සකස් කිරීම සඳහා තවත් සති තුනකට ආසන්න කාලයක් ගත විය. ඒ අනුව දෙසැම්බර් 26 දින ඡන්දය පැවැත්වීමේ නිවේදනය නිකුත් කිරීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දීමට 2022.12.08 දින මැතිවරණ කොමිෂන් සභාව ඒකමතිකව තීරණය කළ අතර, පසුව 2022.12.23 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ දී එය 2023 ජනවාරි 05 දිනට ප්‍රථම සිදු කිරීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් ලබා දීමට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත 5 වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දුන් උපදෙස් අනුව 2023 ජනවාරි 04 දින දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් අදාළ නාමයෝජනා පිළිබඳ දැන්වීම නිකුත් කරමින් නාමයෝජනා භාර ගැනීම 2023 ජනවාරි 18 සිට 21 දින මධ්‍යාහ්න 12.00 දක්වා බවටත්, නාමයෝජනා භාර ගන්නා ස්ථාන හා ඒ සඳහා පත් කරනු ලැබූ තේරීම්භාර නිලධාරී නම ආදිය සඳහන් නාමයෝජනා කැඳවීමේ දැන්වීම් පළ කරන ලදී. එම නාමයෝජනා කැඳවීමේ දැන්වීම අනුව පළාත් පාලන ආයතන 339ක් සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 59 හා ස්වාධීන කණ්ඩායම් 329 නාමයෝජනා භාර දී ඇත.

නාමයෝජනා භාර ගැනීම අවසන් වීමෙන් පසුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත 2023.03.09 දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත බව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 38(1) වගන්තිය ප්‍රකාරව අංක 2317/02 සිට 2317/26 දක්වා අතිවිශෙෂ ගැසට් පත්‍ර 25 මගින් නිවේදනය කර ඇත.

මෙම ඡන්ද විමසීමට අදාළව පහත සඳහන් ගැසට් නිවේදන මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ණ එකඟතාව මත නිකුත් කරනු ලැබ ඇත.

| අනු අංකය | විස්තරය | ගැසට් පත්‍රයේ අංකය | නිකුත් කරන ලද දිනය |
|---|---|---|---|
| 01. | 4(1) වගන්තිය යටතේ තේරීම්භාර නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කිරීම | 2311/26 | 2022.12.21 |
| 02. | 4(1) වගන්තිය සමඟ කියවෙන 27(1) වැනි වගන්තිය යටතේ එක් එක් පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරීන් පත් කිරීම | 2311/27 | 2022.12.21 |
| 03. | පිළිගත් දේශපාලන පක්ෂ 07 ගැසට් නිවේදනය | 2311/32 | 2022.12.27 |
| 04. | ඡන්ද හිමි නාමලේඛන ප්‍රදර්ශනය කිරීම | 2312/04 | 2022.12.27 |
| 05. | පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව ගැසට් නිවේදනය | 2312/31 | 2022.12.28 |
| 06. | එක් එක් පළාත් පාලන ආයතනය වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු අපේක්ෂක සංඛ්‍යාවන් පිළිබඳ විස්තරය දැක්වෙන ගැසට් නිවේදනය | 2312/44 | 2022.12.29 |
| 07. | ආචාර ධර්ම ගැසට් නිවේදනය | 2313/31 | 2023.01.04 |
| 08. | විධාන ගැසට් නිවේදනය | 2313/32 | 2023.01.06 |
| 09. | මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය | 2313/33 | 2023.01.06 |
| 10. | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වැනි අධිකාරය) | 2313/58 | 2023.01.06 |
| 11. | තරුණයා සම්බන්ධයෙන් වන ගැසට් නිවේදනය | 2314/06 | 2023.01.09 |
| 12. | 76අ වගන්තිය යටතේ දැන්වීම - තරුණයා පිළිබඳව | 2314/06 | 2023.01.09 |
| 13. | බාධා ඉවත් කිරීමට අදාළව ගැසට් නිවේදනය - 76අ වගන්තිය | 2314/67 | 2023.01.13 |
| 14. | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරය) 27අ වගන්තිය යටතේ දැන්වීම (පිළිගත් දේශපාලන පක්ෂවල නම්) | 2315/05 | 2023.01.16 |
| 15. | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරය) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ සඳහන් කාර්යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂ සඳහා වෙන් කරන ලද ලකුණු හා වෙන් නොකරන ලද ලකුණු | 2315/06 | 2023.01.16 |
| 16. | 76අ වගන්තිය යටතේ බාධා ඉවත් කිරීමේ ගැසට් නිවේදනය | 2315/12 | 2023.01.17 |
| 17. | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරය) 76අ වගන්තිය යටතේ නියමය අත්‍යවශ්‍ය රාජකාරිවල සේවයේ නියුක්ත කර වීමට අපේක්ෂිත නිලධාරීන් හා සේවක පිරිස ඇතුළත් කිරීම | 2315/27 | 2023.01.18 |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හා ඊට අදාළ පළාත් පාලන ඡන්ද විමසීමේ ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව පළාත් පාලන ඡන්ද විමසීමේ දිනය ප්‍රකාශ කිරීම, නාමයෝජනා භාර ගැනීම හා ඡන්ද විමසීම් දිනය ප්‍රකාශ කිරීම සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිමල් ජී. පුංචිහේවා
**නිමල් ජී. පුංචිහේවා**
**සභාපති**
**මැතිවරණ කොමිෂන් සභාව**